ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ශ්‍රී ලංකා මහ බැංකුව |
|---|---|
| දිනය | 2018.12.04 |

## අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනයෙහි (සියැසන් - SEACEN) අධිපතිවරුන්ගේ 54 වෙනි සමුළුව/ උසස් මට්ටමේ සම්මන්ත්‍රණය හා සියැසන් අධිපති මණ්ඩලයෙහි 38 වෙනි රැස්වීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සියැසන් අධිපතිවරුන්ගේ 54 වෙනි සමුළුව/උසස් මට්ටමේ සම්මන්ත්‍රණය හා සියැසන් අධිපති මණ්ඩලයෙහි 38 වෙනි රැස්වීම 2018 වසරේ නොවැම්බර් මස 29 වනදා සිට දෙසැම්බර් මස 02 වනදා දක්වා කොළඹ දී පැවැත්වීමට අනුග්‍රහය දක්වන ලදී. එම සමුළුව සඳහා සියැසන් සාමාජික[1] මහ බැංකු හා මූල්‍ය අධිකාරීන්හි අධිපතිවරු සහ නියෝජිතයෝ සහභාගි වූහ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නියෝජ්‍ය කළමනාකාර අධ්‍යක්ෂ, මිත්සුහිරෝ ෆුරුසාවා මහතා ප්‍රධාන දේශකයා ලෙස සමුළුවට සහභාගි විය.

සියැසන් මධ්‍යස්ථානය ආසියා පැසිෆික් කලාපය තුළ මූල්‍ය, මුදල් හා බැංකු ආශ්‍රිත කරුණු පිළිබඳව වඩාත් පුළුල් අවබෝධයක් ලබාදීම සම්බන්ධයෙන් වැදගත්

[1] අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනය (සියැසන්) බෲනායි දරුසලාම්, කාම්බෝජය, චීනය, ඉන්දියාව, ඉන්දුනීසියාව, හොංකොං, කොරියාව, ලාඕසය, මැලේසියාව, මොංගෝලියාව, මියන්මාරය,නේපාලය, පැපුවා නිව් ගිනියාව, පිලිපීනය, සිංගප්පූරුව, ශ්‍රී ලංකාව, චීන තායිපේ, තායිලන්තය සහ වියට්නාමය යන සාමාජික රටවල් සහ මූල්‍ය අධිකාරීන් 19 දෙනෙකුගෙන් මෙන්ම අනුබද්ධ සාමාජිකයින් 8 ක් සහ නිරීක්ෂකයන් 8 ක ගෙන් සමන්විත වේ.

කාර්යභාරයක් ඉටු කරයි. 1982 වර්ෂයේදී පිහිටුවන ලද සියැසන් ආයතනය ආසියා පැසිෆික් කලාපයේ පිහිටි මහ බැංකු හා මූල්‍ය අධිකාරීන්ට අධ්‍යාපනික වැඩසටහන්, පර්යේෂණ කටයුතු සහ සම්බන්ධතා හරහා සිය සේවා ලබාදෙයි.

මෙවර සම්මේලනයේ තේමාව වූයේ “ශීඝ්‍රයෙන් වෙනස් වන වාතාවරණයක මුදල් ප්‍රතිපත්තිය” යන්නයි. ආරම්භක දේශනයේදී ෆුරුසාවා මහතා විසින් ප්‍රධාන සාර්ව ආර්ථික මූලිකාංග ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරමින් ආසියාවේ වත්මන් ආර්ථික ප්‍රතිපත්ති සහ ඉදිරි දැක්ම පිළිබඳව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අදහස් ඉදිරිපත් කරන ලදී. අඛණ්ඩ සුපරීක්ෂාකාරීබව, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ දිරිමත් කිරීම, විචක්ෂණශීලී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති, මහ බැංකුවල විශ්වසනීයත්වය සුරක්ෂිත කිරීම සහ ක්ෂුද්‍ර හා සාර්ව විචක්ෂණශීලී ප්‍රතිපත්ති සම්මිශ්‍රණය තුළින් මූල්‍ය ආයතන ශක්තිමත් කිරීම සහතික කිරීම තවදුරටත් අවශ්‍යව පැවතියද, සමස්තයක් ලෙස අනාගත මුදල් සහ මූල්‍ය අභියෝග සඳහා මුහුණ දීමට ආසියානු ආර්ථික යහපත් මට්ටමක පවතී.

මෙම සමුළුව/ඉහළ මට්ටමේ සම්මන්ත්‍රණය සැසිවාර තුනකින් සමන්විත විය. පළමු සැසිවාරයේදී අධිපතිවරු වේගවත් තාක්ෂණික වෙනස්කම් සහ අනාගතයේදී ව්‍යවහාර මුදල් නිකුත් කිරීම සඳහා එහි බලපෑම පිළිබඳව සාකච්ඡා කළහ. මෙහි ප්‍රධාන දේශකවරයා වූ ස්වීඩන් මහ බැංකුවේ නියෝජ්‍ය අධිපති සිසිලියා ස්කින්ග්ස්ලි මහත්මිය ස්විඩනය ආශ්‍රිතව ව්‍යවහාර මුදල් භාවිතය සැලකිය යුතු ලෙස පහත වැටීම, ගෙවීම් සඳහා විකල්ප විද්‍යුත් මාධ්‍ය භාවිතා කිරීම ඉහළ යෑම සහ මහ බැංකු විසින් ඩිජිටල් ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ අපේක්ෂාවන් පිළිබඳව අන්දැකීම් විස්තර කළාය.

මුදල් ප්‍රතිපත්ති රාමුවල ඇති ගැටලු සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරමින් ලෝක බැංකුවේ සංවර්ධන අපේක්ෂාවන් පිළිබඳ කණ්ඩායමේ අධ්‍යක්ෂක, ආචාර්ය අයාන් කෝසේ විසින් නැඟී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි උද්ධමනය පිළිබඳ සාධක සහ උද්ධමනයෙහි ස්වරූපය පිළිබඳව දෙවන සැසිවාරයේදී ප්‍රධාන දේශනය පවත්වන ලදී. උද්ධමනය තීරණය කරන සාධකවල වෙනස්වීම නිසා සිදුවන බලපෑම් පිළිබඳව අධිපතිවරුන් විසින් සාකච්ඡා

කළ අතර, එහිදී දේශීය සාධකවලට වඩා විදේශීය සාධක කෙරෙහි අවධානය යොමු කරන ලදී. දියුණු රටවල ආර්ථිකයන් ප්‍රකෘති තත්ත්වයට පත්වන විට ගෝලීය මිල පීඩනයන් ඉහළ යන අවස්ථාවලදී නැඟී එන වෙළඳපොළවල මහ බැංකු විසින් ප්‍රතිචාර දැක්විය යුත්තේ කෙසේද යන්න සාකච්ඡාවට බඳුන් වූ තවත් මාතෘකාවක් විය.

තෙවන සැසිවාරය තුළදී අයිස්ලන්ත මහ බැංකු අධිපති මා ගුඩ්මන්ඩ්සන් මහතා විසින් කුඩා, විවෘත, මූල්‍යමය වශයෙන් ඒකාබද්ධ වූ ආර්ථිකයක් ලෙස අයිස්ලන්තයෙහි ප්‍රතිපත්තිමය අභියෝග පිළිබඳව අදහස් පළ කළේය. ශීඝ්‍රයෙන් වෙනස්වන වාතාවරණයක් තුළ මුදල් ප්‍රතිපත්තිය හැසිරවීම සම්බන්ධයෙන් වූ කලාපීය අත්දැකීම් සහ භූ දේශපාලනික අවදානම්, විෂම ආර්ථික වර්ධනය, මූල්‍ය අසමබරතා ක්‍රමයෙන් වැඩිවීම, දේශපාලනික කාරණා වඩා මූලික වූ තත්ත්වයක් තුළ මුදල් ප්‍රතිපත්තිය හැසිරවීමට සිදුවීම සහ ප්‍රාග්ධන ප්‍රවාහවල විචලතාවය යනාදී ලෝක ආර්ථිකයේ පවත්නාවූ පුළුල් වර්ධනයන් හමුවේ වූ සිය අත්දැකීම් පිළිබඳව අධිපතිවරු සිය අදහස් හුවමාරු කර ගත්හ. දේශපාලනික අස්ථාවරත්වය තුළින් පැන නඟින ව්‍යාකූලතා සහ මහ බැංකුවල ස්වාධීනත්වය කෙරෙහි එල්ල වන බලපෑම් තුළින් මුදල් සහ මූල්‍ය ස්ථායීතාව කෙරෙහි එල්ල වන අවදානම් ඇගයීම් වඩාත් අභියෝගාත්මක වී ඇති බව අධිපතිවරුන්ගේ මතය විය.

38 වන සියැසන් අධිපති මණ්ඩල රැස්වීමේදී ශ්‍රී ලංකා මහ බැංකු අධිපති, ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා සියැසන් අධිපති මණ්ඩලයෙහි සභාපති ලෙස තෝරා පත් කර ගැනුණි.






MONETARY POLICY IN A RAPIDLY
EVOLVING ENVIRONMENT


The SEACEN Centre
54th SEACEN GOVERNORS' CONFERENCE / HIGH - LEVEL SEMINAR
AND
38th MEETING OF THE SEACEN BOARD OF GOVERNORS
MONETARY POLICY IN A RAPIDLY
EVOLVING ENVIRONMENT
29 November - 02 December 2018